**පුවත් පත් නිවේදනය**

# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය (OMP) පිහිටුවීමෙහිදී හා ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල හා නෛතික කාර්ය රාමුවට අනුකූලව කටයුතු කිරීමේ වැදගත්කම

***2017 ජූලි 24 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව:*** ඇමතිවරුන් හට විෂයන් සහ කාර්යයන් වෙන්කර දීමෙහි දී - විශේෂයෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය සම්බන්ධයෙන් - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන් හට අනුකූලව ක්‍රියාකිරීමට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අසමත් වීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය සැලකිල්ල යොමුකර සිටී. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා 2017 ජූලි 19 වන දින 2028/45 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය මඟින් අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳව වූ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය හා කාර්යභාරයන් ඉටු කිරීම) පිළිබඳව වූ 2016 අංක 14 දරන පනත ජාතික ඒකාබද්ධතාවය සහ සංහිඳියාව පිළිබඳව වූ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කල යුතු නීතියක් ලෙස ගැසට් කරනු ලැබිණි. එසේ කිරීම මඟින් ජනාධිපතිවරයා විසින් විශාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වියවුල් සහගත බවක් ඉස්මතු කරනු ලැබිණි.

2015 අප්‍රේල් 28 වන දින පනවනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මඟින් සපයා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කාර්ය රාමුව පිළඹඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය අවධානය යොමුකොට සිටී. 19 වන සංශෝධනයට පෙර, වෙනත් කැබිනට් අමාත්‍යවරයෙකු වෙත පවරණු ලැබ නොමැති ඕනෑම කාර්යයක් තමාහට පවරා ගැනීමට ජනාධිපතිවරයා හට ව්‍යවස්ථානුකූල බලය තිබිනි. මෙම ප්‍රතිපාදනය 19 වන සංශෝධනය මඟින් අහෝසි කරනු ලැබිණි. කෙසේ නමුත් 19 වන සංශෝධනය බලාත්මක කිරීම ඇරඹෙන දිනයේදී ජනාධිපතිධුරය දරන තැනැත්තා සම්බන්ධයෙන් විශේෂ ව්‍යතිරේකයක් ඇතිකරනු ලැබිනි.

2015 අගෝස්තු මහා මැතිවරණයෙන් පසු ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (2) ව්‍යවස්ථාවට අනුව ගැසට් පත්‍ර දෙකක් නිකුත් කරමින් යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට අමාත්‍යාංශ භාරවන සේ පත්වීම් සිදු කරනු ලැබිනි. ඉන්පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව 2015 සැප්තැම්බර් 21 වන දින දරන 1933/13 (අති විශේෂ) ගැසට් පත්‍රය මඟින් මුලින් වෙන්කර දෙනු ලැබූ අමාත්‍යාංශ වලට විෂයයන් සහ කාර්යයන් පවරණු ලැබිනි.

වැඩිදුරටත් මෙම (2015 සැප්තැම්බර් 21 දිනැති 1933/13) ගැසට් පත්‍රය මඟින් ;

- '' ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියා'' අමාත්‍යාංශයක් පිහිටුවනු ලැබූ අතර එය කිසිඳු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට වෙන්කරණු නොලැබිනි. මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු යම් පනත් නිෂ්චිත ලෙස දැක්වීමක්ද මෙම ගැසට් පත්‍රයේ නොතිබිනි.

- වෙනත් යම් අමාත්‍යවරයෙකුට නිෂ්චිත ලෙස පවරනු නොලැබූ සියළු විෂයයන්, කාර්යයන්, සහ දෙපාර්මේන්තු, රාජ්‍ය සංස්ථාවන් සහ නීතිගත ආයතනයන් ජනාධිපතිවරයාහට වෙන් කරනු ලැබිනි.

කෙසේ නමුත්, 19වන සංශෝධනයේ 51 වන ඡේදයේ නිෂ්චිත ලෙස දක්වා ඇති විෂයයන් හා කාර්යයන්ගෙන් බාහිර කිසිඳු විෂයයක් හෝ කාර්යයක් තමන් වෙත පවරා ගැනීමට ජනාධිපතිවරයා හට බලයක් නොමැත. එබැවින් ජනාධිපතිවරයාහට ජාතික එකාබද්ධතාවය හා සංහිඳියාව පිළිබඳ අමාත්‍යවරයාගේ බලතල පවරනු ලැබූ, 2015 සැප්තැම්බර් 21 වන දින දරණ 1933/13 (අතිවිශේෂ) ගැසට් පත්‍රයෙහි කොටස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවේ.

ජනාධිපතිවරයා විසින් ජාතික ඒකාබද්ධතාවය හා සංහිඳියාව පිළිබඳ අමාත්‍යවරයා ලෙස යම් හෝ බලතල තමාවෙත පවරාගනු නොලබන තාක්කල් මෙය හුදු ශාස්ත්‍රීය කරුණක් වන්නට තිබිනි. නමුත් 2028/45 (අතිවිශේෂ) ගැසට් පත්‍රය මඟින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යලය ජාතික ඒකාබද්ධතාවය සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යවරයා හට පවරනු ලැබීම මගින් එබඳු පියවරයන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානු තුල භාවය පිළිබඳව බරපතල කනස්සල්ල දනවනු සුළු තත්ත්වයක් උද්ගත කරවනු ලැබ ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය ක්‍රියාත්මක කිරීමෙහිදී

අමාත්‍යවරයා විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය පනතෙහි 1 (2) ඡේදය ප්‍රකාර ගැසට් පත්‍රය නිකුත් කල යුතුව ඇත. එසේ කිරීම මගින් ජනාධිපතිවරයා විසින් ජාතික ඒකාබද්ධතා හා සංහිඳියා අමාත්‍යවරයා ලෙස ක්‍රියා කරනු ඇත. ජනාධිපතිවරයා විසින් ජාතික ඒකාබද්ධතාවය හා සංහිඳියාව භාර අමාත්‍යවරයා ලෙස එබඳු ගැසට් නිවේදනයක් නිකුත් කිරීම මගින් එසේ ස්ථාපිත කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල වලංගුභාවය පිළිබඳව ප්‍රශ්නයන් මතුකරනු ඇතැයි යන්න විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි විශ්වාසය වේ.

මතුපිටින් බලනකල අතපසුවීමක් සේ පෙනෙන නමුත් නිවැරදි කරනු නොලැබුවහොත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි වන සැලකිලිමත් භාවයෙහි අඩුවක් සේ දිස්වන මෙම තත්ත්වය පිළිබඳ ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන වලට අනුකූලව ක්‍රියාත්මක වීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගෙන ජනාධිපතිවරයා නොවන වෙනත් අමාත්‍යවරයෙකු හට ජාතික ඒකාබද්ධතා සහ සංහිඳියාව පිළිබඳ අමාත්‍යාංශය පැවරීම හෝ අතරුදහන් වූ තැනැත්තන් පිළිබඳ වූ කාර්යාලය වෙනත් අමාත්‍යාංශයකට පැවරීමට කටයුතු කරන මෙන් විකල්ප ප්‍රතිපත්ති නේක්ද්‍රය ජනාධිපතිවරයාගෙන් සහ රජයෙන් ඉල්ලා සිටී. එසේ කිරීමට අපොහොසත් වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් හා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය පනත පැනවීම තුලින් රජය විසින් ගන්නා ලද සාධනීය පියවරයන් නිශේධ කිරීමක් වන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කරයි. ඉනික්බිතිව අදාළ අමාත්‍යවරයා විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යලය පනතෙහි දක්වා ඇති පරිදි ගැසට් නිවේදනයක් නිකුත් කිරීම මගින් පනත ක්‍රියාකාරී බවට පත්කළ යුතුය. මින් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය සඳහා ප්‍රසිද්ධ නාමයෝජනාවන් කැඳවිය යුතු බවත් එසේ තෝරා ගනු ලැබ ජනාධිපතිවරයාට නිර්දේශ කරනු ලබන අයවලුන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව වූ කාර්යාලය ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ විශේෂඥතාවය, කුසලතාවය, හා විවිධත්වය සහිත අයවලුන් වන බව සහතික කළයුතු බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඉල්ලීමයි. එමෙන්ම වඩාත් වැදගත් වන කරුණක් වන්නේ වින්දිතයින්ගේ, බලපෑ ප්‍රජාවන්ගේ හා සිවිල් සමාජයේ විශ්වාසය දිනාගැනීමට ඔවුන් සමත් විය යුතු බවයි. මේ සම්බන්ධයෙන් නිසි කලට අදාළ ක්‍රියාමාර්ග ගැනීම පිණිස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් <u>මින්පෙර කළ ඉල්ලීම්</u> හා දහස් ගණනක් වූ ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දුක්ගැනවිලි වලට ආමන්ත්‍රණය කරන පළමු ස්වාධීන යාන්ත්‍රණය ස්ථාපිත කරන ලෙස වන තම ඉල්ලීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත අවධාරණය කර සිටී.